[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| නැටුම් (දේශීය) | I, II |
| நடனம் (சுதேச) | I, II |
| Dancing (Indigenous) | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න 30 ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය, **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** සහ **IV** යන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) වරණ අතරින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

### I කොටස

● අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු වචන තෝරන්න.

1. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දී **'තලිය'** ................................... වාද්‍ය භාණ්ඩයක් ලෙස ගැනේ.
(1) විතත (2) විතතාතත (3) ඝණ (4) සුසිර

2. **දොඹින පද** සහ **කොලොන්න පද** ................................... නර්තන සම්ප්‍රදායට අයත් වේ.
(1) උඩරට (2) පහතරට (3) සබරගමු (4) ජන

3. **ශම** භාවය තුළින් ජනිත වන්නේ ........................ රසයයි.
(1) කරුණ (2) ශාන්ත (3) ශෘංගාර (4) හාස්‍ය

4. උඩරට නර්තන සම්ප්‍රදායෙහි වැඩි වශයෙන් භාවිත **නොවන්නේ** ........................ අභිනයයි.
(1) ආංගික (2) වාචික (3) සාත්වික (4) ආහාර්ය

5. නර්තන පුහුණුවට පෙර තෙල් ආලේප කොට ශරීර සම්බාහන ක්‍රියාවලියක් සිදු කරනු ලබන්නේ ........................ නර්තන සම්ප්‍රදායේ දී ය.
(1) කථකලි (2) මණිපුරි (3) කථක් (4) කුච්චිපුඩි

6. බෙර වාදනයේ භාවිත ස්වරාක්ෂර බීජාක්ෂර ලෙස ද, ........................ ගර්භාක්ෂර ලෙස ද හැඳින්වේ.
(1) ධ්වනි අක්ෂර (2) උපකාරාක්ෂර (3) දෘඪාක්ෂර (4) ඝන අක්ෂර

7. සමාජීය හා සංස්කෘතික උත්සවයන්හි ........................ සාමූහික වාදනයක් ලෙස යොදා ගනී.
(1) අණබෙර (2) රණබෙර (3) බුම්මැඩිබෙර (4) බංකු රබන්

[දෙවැනි පිටුව බලන්න.

8. චිත්‍රසේන මහතා විසින් නිෂ්පාදිත නලදමයන්ති මුද්‍රා නාටකයේ හංස ධේනුවගේ චරිතය ඉදිරිපත් කරන ලද්දේ ......................... ශිල්පිනිය විසිනි.

(1) වජිරා චිත්‍රසේන
(2) රජිනි සෙල්වනායගම
(3) චිත්‍රා අල්ගම
(4) මාලතී සෝමබන්ධු

9. 'නන් උතුම් පෙමබර ගුණ රුසිරු රබානා
දැන් මෙමන් අතින් රැගෙන ....................'

(1) වයති රබානා
(2) රඟති මනාවා
(3) කරකවමි මනා
(4) ගනිමි වෙන වෙනා

10. බෙරහඬ නාටකයේ "හනික වරෙව් කොල්ලනේ" ගීතයේ නර්තන නිර්මාණය සඳහා ......................... සම්ප්‍රදායයෙන් ආභාසය ලබා ඇත.

(1) උඩරට (2) සබරගමු (3) නාඩගම් (4) පහතරට

11. වේගයෙන් භ්‍රමණයවන ස්වරූපයක් සහිත නළඟනකගේ ලෝකඩ රූපයක් සොයාගනු ලැබුවේ,

(1) අනුරාධපුර කුට්ටම් පොකුණෙන් ය.
(2) ඇම්බැක්කේ දේවාලයෙන් ය.
(3) පොළොන්නරුව ශිව දේවාලයෙන් ය.
(4) දැදිගම කොටවෙහෙරෙන් ය.

12. **මෙලෙයි යකුන්** සහ **රුප්පා යකුන්** පුද ලබන ශාන්තිකර්මය වන්නේ

(1) සන්නියකුම ය.
(2) ගම්මඩුව ය.
(3) කොහොඹා කංකාරිය ය.
(4) දෙවොල් මඩුව ය.

13. 'හෙට්ටිරාළ බැහැ දැක සැල කළ විට - නැටුම නියම වුණි ඒ සත්දෙන හට'
මෙම කවිපද ගායනා කරන්නේ,

(1) ආරච්චි කෝළමේ දී ය.
(2) මරක්කල නාටකයේ දී ය.
(3) මුදලි කෝළමේ දී ය.
(4) සොකරි නාටකයේ දී ය.

14. කේලිකොත්තු, තෝඩායම් හා පුරප්පාඩි යන අංග අයත් නර්තන සම්ප්‍රදාය වන්නේ,

(1) භරත නාට්‍යම් ය.
(2) කථකලි ය.
(3) මණිපුරි ය.
(4) කථක් ය.

● අංක 15 සිට 18 තෙක් ප්‍රශ්නවලට පහත ඡායාරූප ඇසුරින් පිළිතුරු සපයන්න.


P


Q


R


S

15. **සබරගමු** නර්තනය සඳහා සුදුසු ඇඳුම් කට්ටලය දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) P ය. (2) Q ය. (3) R ය. (4) S ය.

16. **යක් ඇනුම** සහ **තෙල්මේ** නර්තනය සඳහා භාවිත කරන ඇඳුම් කට්ටල් දෙක දැක්වෙන ඡායරූප වන්නේ පිළිවෙළින්,

(1) P සහ Q ය. (2) Q සහ R ය. (3) R සහ S ය. (4) P සහ S ය.

17. **දෙවොල්මඩු** ශාන්තිකර්මයේ එන නර්තන අංග දෙකක් ඇතුළත් ඡායාරූප වන්නේ,

(1) P සහ R ය. (2) P සහ Q ය. (3) Q සහ R ය. (4) Q සහ S ය.

18. **ආවැන්දුම** සහ **සබරගමු** සම්ප්‍රදායයේ දෙවොල් නර්තනය සඳහා සුදුසු ඇඳුම් කට්ටල දැක්වෙන ඡායාරූප වන්නේ පිළිවෙළින්,

(1) P සහ S ය. (2) P සහ R ය. (3) Q සහ S ය. (4) R සහ S ය.

[අනෙක් පිටුව බලන්න

CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

19. චිත්‍රණය, හැඩතල සහ ඇඹීමේ කලාව සාජුවම දක්නට ලැබෙන ශාන්තිකර්මය වන්නේ,
(1) දෙවොල් මඩුවයි. (2) බලි යාගයයි.
(3) කොහොඹා කංකාරියයි. (4) පහන් මඩුවය.

20. මණිපුරි නර්තනයට යොදා ගන්නා අවනද්ධ භාණ්ඩ වන්නේ,
(1) කෝල්බෙරය සහ මංජීරාවයි. (2) කෝල්බෙරය සහ මෘදංගයයි.
(3) කෝල්බෙරය සහ පුංග් බෙරයයි. (4) පෙනකොම්බාව සහ පුංග් බෙරයයි.

21. ගම්පොළ යුගයේ දී මෙරට ලී කෙළි නැටුම් පැවති බව සනාථ වන්නේ,
(1) ගඩලාදෙණිය විහාරයෙහි පාදමේ රූකම්වලිනි.
(2) රිදී විහාරයේ දොරෙහි කැටයම් කර ඇති රූකම්වලිනි.
(3) ඇම්බැක්ක දේවාලයේ ලී බාල්කයේ රූකම්වලිනි.
(4) මැදිරිගිරියේ වටදාගෙයෙහි රූකම්වලිනි.

22. උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්හි ඇඳුම් කට්ටලවලට අයත් කොටස් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) හැඩකැල්ල, කාගුල් කුට්ටම, උරබාහු (2) නෙත්තිමාලය, හැඩකැල්ල, සේලය
(3) කෙයිමෙත්ත, හැඩකැල්ල, සේලය (4) අවුල්හැරය, කාගුල් කුට්ටම, හැඩකැල්ල

23. සරසන ලද කළයක් හිසමත තබාගෙන සමබරතාවෙන් යුතුව නර්තනයේ යෙදෙන ඉන්දියානු ගැමි නර්තනයකි,
(1) කෝලාට්ටම්. (2) කරගම්. (3) කාවඩි. (4) බෙම්බු.

24. කුඹුරුපනත සහ තම්බපණ්ණි යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
(1) වසන්ත කුමාර මහතා ය. (2) ශේෂා පලිහක්කාර මහතා ය.
(3) නිමල් වෙල්ගම මහතා ය. (4) ප්‍රේමකුමාර එපිටවෙල මහතා ය.

- අංක 25 සිට 27 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | X | Y | Z |
|---|---|---|---|
| 1 | අංග රචනය | දිසා, තල | සාමූහික බව |
| 2 | තේමාව | එමකම | පසුබිම් සංගීතය |
| 3 | ශාස්ත්‍රීය බව | අවකාශ භාවිතය | වෙස් මෝස්තර රචනය |

25. ආහාර්ය අභිනයට අයත් ප්‍රධාන කොටස් දෙක සඳහන් වරණය තෝරන්න.
(1) 1 X හා 3 Z (2) 1 X හා 2 Y (3) 2 X හා 2 Z (4) 1 X හා 3 Y

26. මුද්‍රා නාට්‍යයක් නිර්මාණයේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු දෙකක් සඳහන් වරණය තෝරන්න.
(1) 2 X හා 2 Y (2) 2 X හා 2 Z (3) 1 X හා 2 Y (4) 1 X හා 1 Z

27. ගැමි නර්තනයක තිබිය යුතු ප්‍රධානතම ලක්ෂණ දෙක දැක්වෙන වරණය තෝරන්න.
(1) 2 Y හා 1 Z (2) 1 X හා 2 Z (3) 3 X හා 2 Z (4) 2 X හා 2 Z

28. 2005 දී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ප්‍රතිසංවිධානය වූයේ, කැලණිය විශ්වවිද්‍යාලීය,
(1) රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයයි. (2) රජයේ ලලිත කලායතනයයි.
(3) සෞන්දර්ය අධ්‍යයන ආයතනයයි. (4) හේවුඩ් ආයතනයයි.

29. කේරළයේ දේවාලවල කථකලි ආරම්භයට මූලිකව ක්‍රියාකළ බ්‍රාහ්මණයින් හැඳින්වෙන්නේ
(1) චක්කියාර්වරු ලෙසිනි. (2) සැමොරින්වරු ලෙසිනි.
(3) තාංජාවුර්වරු ලෙසිනි. (4) නායක්කාර්වරු ලෙසිනි.

30. භරත නර්තන සම්ප්‍රදායයේ නට්ටුවනාර් විසින් තාල තැබීම සඳහා යොදා ගනු ලබන්නේ,
(1) තලිය ය. (2) කයිතාලම් ය.
(3) තාලම්පට ය. (4) තපුවාංගම ය.



CamScanner

## II කොටස - උඩරට නර්තනය

31. කොහොඹා කංකාරියේ මුරුතැන් පිසීම සඳහා ජලය (පැන්) ලබා ගැනීම හා සම්බන්ධ චාරිත්‍ර විධිය වන්නේ,
(1) තොට පේ කිරීම ය. (2) පැන් පේ කිරීම ය.
(3) ජල පේ කිරීම ය. (4) තොටමෙට යාම ය.

32. දේව දානය සඳහා අස්වැන්නෙන් කොටසක් වෙන් කිරීම කොහොඹා කංකාරියේ දී හඳුන්වනුයේ
(1) මුරුතැන් වෙන් කිරීම ය. (2) අස්වැන්න වෙන් කිරීම ලෙස ය.
(3) කරල් නැබීම ලෙස ය. (4) අත්යාල වෙන් කිරීම ලෙස ය.

33. කොහොඹා කංකාරියේ දී පොල් පන්දමක් සහ ඊ ගහක් අතැතිව ඉදිරිපත් කරනු ලබන නර්තනාංගය කුමක් ද?
(1) කොහොඹා හැල්ල (2) දූනුමාලප්පුව
(3) මඩුපුරය (4) අස්නෙ

34. කොහොඹා කංකාරියේ එන කුඩා ගුරු හා මහ ගුරු චරිත ඇතුළත් නාට්‍යමය පෙළපාළියක් වන්නේ,
(1) ආඩිගුරු නැටීම ය. (2) ගුරුගේමාලාව ය.
(3) බොරු යක්කම ය. (4) ගබඩාකොල්ලය ය.

35. වාදනයේ දී තත්, ජිත්, තොං, නං යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) බීජාක්ෂරයි. (2) ගර්භාක්ෂරයි.
(3) ශුද්ධාක්ෂරයි. (4) අනුඅක්ෂරයි.

36. 'කොහොඹා කංකාරිය හා සමාජය' යන ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය ලයනල් බෙන්තරගේ ය. (2) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් ය. (4) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ ය.

37. ධ්වනි නිෂ්පත්තිය සඳහා නියඟ කෙඳි යොදා ගන්නා අතත ඝණයේ වාද්‍ය භාණ්ඩයකි,
(1) ගැට බෙරය. (2) පහතරට බෙරය.
(3) දවුල. (4) උඩැක්කිය.

38. පහත සඳහන් අඩව්වෙහි හිස්තැන් සඳහා සුදුසු පද කොටස් පිළිවෙළින් ඇතුළත් වරණය කුමක් ද?
"ජෙං තත්තත් ........... තත්තත් ........... තත්තත් ජෙං තා"
(1) ජෙනු, ජෙනු (2) ජෙං, ජෙං
(3) ජෙං, ජෙනු (4) ජෙනු, ජෙං

39. "කුඳ ගත ගත දොම්" යන බෙර පදය වාදනය කළ හැකි තාල රූපයක් සඳහන් වරණය තෝරන්න.
(1) මාත්‍රා 2 + 4 (2) මාත්‍රා 3 + 4
(3) මාත්‍රා 2 + 2 + 4 (4) මාත්‍රා 2 + 3 + 4

40. "දොං ජිංත ගත දොම්ත" යන බෙර පදයට නර්තනය කළ හැකි වන්නම කුමක් ද?
(1) තුරඟා වන්නම (2) සිංහරාජ වන්නම
(3) නයියඩි වන්නම (4) හනුමා වන්නම

[පස්වැනි පිටුව බලන්න

CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

[සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| නැටුම් (දේශීය) | I, II |
| நடனம் (சுதேச) | I, II |
| Dancing (Indigenous) | I, II |

## නැටුම් (දේශීය) II

- ※ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමි වේ.

1. **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

   (i) නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථය ................................ විසින් රචනා කර ඇත.

   (ii) ක්‍රිෂ්ණ සඳහා වෙන්වූ සුවිශේෂ මකුට පලඳනාව ................................ නමින් හැඳින්වේ.

   (iii) ශාන්තිකර්ම ත්‍රිත්වයෙහිම පූර්ව චාරිත්‍රයක් ලෙස සුබ නැකතින් ................................ සිදුකරනු ලබයි.

   (iv) දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් පන්සියයක් නර්තනයේ යෙදුන බව ................................ ගේ වාර්තාවෙන් හෙළිවේ.

   (v) කථකලි නර්තනය ප්‍රචලිත කිරීම සඳහා ........................................... නමින් ආයතනයක් පිහිටුවන ලදී.

   (vi) සැලළිහිණිය සහ පරෙවිය මුද්‍රානාට්‍ය ........................................ විසින් නිර්මාණය කරන ලදී.

   (vii) බලි තොවිල්වලදී රෝගී තැනැත්තා හඳුන්වනු ලබන්නේ ................................ නමිනි.

   (viii) ගීතයේ අර්ථය නර්තනය මගින් ඉදිරිපත් කිරීමට වඩාත් උචිත වන්නේ ................................ වලනයි.

   (ix) පහත සඳහන් මංගල අවස්ථා අන්තර්ගත නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

   (අ) හිස වෙස් බැඳීමේ මංගල්‍යය : ......................................

   (ආ) මඩු බැසීමේ මංගල්‍යය : ......................................

   (x) පහත සඳහන් එක් එක් නර්තනාංගය අයත් භාරතීය නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

   (අ) පරන් : ......................................

   (ආ) රාස්ලීලා : ......................................

2. පහත දැක්වෙන (i) සහ (ii) ප්‍රශ්න අංකවලට පිළිතුරු සැපයීමේ දී **එක් සම්ප්‍රදායක් පමණක්** තෝරා ගත යුතුවේ.

   (i) සිංහරාජ වන්නමේ හෝ අනුරාගදණ්ඩතාලය සින්දු වන්නමේ හෝ විරාඩි වන්නමේ හෝ බෙරපදය ප්‍රස්තාරගත කරන්න.

   (ii) මැදුම් මහ දෙතිතට අයත් අඩව්වක් හෝ දෙසුළු මැදුම් තුන්තිතට අයත් ඉරට්ටියක් ප්‍රස්තාරගත කරන්න.

   (iii) "වන්දනම් යස තේජ කුංකුම" යන ප්‍රශස්තිය මැදුම් තනිතිතට අනුව අවග්‍රහයෙන් ප්‍රස්තාරගත කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

   (i) වන්නම්, සින්දු වන්නම්වල පොදු ලක්ෂණ

   (ii) ජසයා සහ ලෙන්චිනා කෝලම

   (iii) හේවිසි වාදනය

   (iv) දෙමළ ගැමි නැටුම්

   (v) ආචාර්ය මිරැන්ඩා හේමලතා

[අටවැනි පිටුව බලන්න

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

4. උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවල අනන්‍ය ලක්ෂණ පිළිබිඹු වේ.
   (i) කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ නාට්‍යමය පෙළපාළි **දෙකක්** නම් කර ඉන් **එකක්** හඳුන්වා දෙන්න.
   (ii) ශාන්තිකර්ම පැවැත්වීමේ වර්තමාන අරමුණු පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
   (iii) ශාන්තිකර්ම පුරාවෘත්තයන්ගෙන් සමාජයට ලබා ගත හැකි ආදර්ශ සාකච්ඡාවට බඳුන් කරන්න.

5. (i) කෝලම් සහ සොකරි ගැමි නාටක පවත්වන ප්‍රදේශ **දෙක** බැගින් නම් කරන්න.
   (ii) සොකරි නාටකයේ එන චරිත **දෙකක්** නම් කර එක් චරිතයකට අයත් කවියක් ලියා දක්වන්න.
   (iii) මහනුවර යුගයේ නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ දේශාටන වාර්තා **දෙකක්** ඇසුරෙන් විමසන්න.

6. (i) ඔංචිලිවාරම් කවි පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   (ii) සමාජයෙහි, සාරධර්ම ගොඩනැගුණු ආකාරය ගැමි නැටුම් හා බැඳි කවි **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.
   (iii) ප්‍රාසංගික වේදිකාවේ දක්නට ලැබෙන ජන නැටුම් නිර්මාණයන්හි වර්තමාන ස්වරූපය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

7. පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(B)



(A)



(C)

   (i) (A) රූපයේ දැක්වෙන චරිත නම් කර, ඔවුන්ගේ ප්‍රේම වෘත්තාන්තය හා බැඳි සුවිශේෂ නර්තනය හඳුන්වන්න.
   (ii) (B) රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍ය නම් කර එම **නාට්‍ය කලාව** ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වූ ආකාරය සැකෙවින් විස්තර කරන්න.
   (iii) (C) රූපයෙන් දැක්වෙන නර්තන කලාව ආහාර්ය අභිනයෙන් පෝෂණය වී ඇති අයුරු විමසන්න.

8. ශාස්ත්‍රීය නර්තනාංග මෙන් ම නව නිර්මාණාත්මක නර්තනාංග ද රසඥතා වර්ධනය කෙරෙහි බෙහෙවින් බලපායි.
   (i) චරිත සඳහා නර්තන නිර්මාණයේදී අවධානය යොමුකළ යුතු කරුණු **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.
   (ii) ගීත අනුව නර්තන නිර්මාණයේදී සැලකිය යුතු ප්‍රධාන කරුණු **දෙකක්** පෙන්වා දෙන්න.
   (iii) ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක නර්තනයක ප්‍රාසංගික බව පවත්වා ගැනීමට හේතුවන කරුණු **දෙකක්**

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner